පෙරහුරු පරීක්ෂණය

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 අගෝස්තු

## ගිණුම්කරණය II

ආචාර්ය හරේන්ද්‍ර කාරියවසම්

පැය තුනයි

*Three Hours*

- පළමු සහ දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

---

**(01)** සීමිත මහේන්ද්‍රන් පොදු සමාගමේ 2015.03.31 දිනට පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුම පහත දී ඇත.

(රු.'000)

| | | |
|---|---|---|
| ඉඩම් (ප්‍රත්‍යාගණිත අගය) | 3,000 | |
| ගොඩනැගිලි | 2,500 | |
| මෝටර් රථ | 3,500 | |
| උපකරණ | 1,500 | |
| ක්ෂය වෙන් කිරීම් (14.04.01) | | |
| - ගොඩනැගිලි | | 850 |
| - මෝටර් රථ | | 1,100 |
| - උපකරණ | | 450 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 100,000) | | 3,000 |
| විකුණුම් | | 14,260 |
| විකුණුම් වගකීම් සහතික වෙන් කිරීම (2014.04.01) | | 800 |
| විකුණුම් පිරිවැය | 6,500 | |
| වෙළඳ තොගය (2015.03.31) (පිරිවැය) | 650 | |
| බෙදා හැරීමේ වියදම් | 750 | |
| පරිපාලන වියදම් | 2,090 | |
| වෙනත් වියදම් | 220 | |
| මූල්‍ය වියදම් | 500 | |
| බදු වෙන් කිරීම් (2014.04.01) | | 300 |
| ගෙවූ බදු | 1,300 | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | 1,440 |
| රඳවාගත් ලාභ (2014.04.01) | | 2,700 |
| ලද කොමිස් | | 120 |
| භාණ්ඩාගාර බිල් (ත්‍රෛමාසික) | 600 | |
| මුදල් හා බැංකු ශේෂය | 720 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 1,190 | |
| | 25,020 | 25,020 |



OpenLearning Powered by Japura Media

අතිරේක තොරතුරු

1) 2015.03.31 දිනට පවතින තොගය තුළ ඇතුළත් පිරිවැය රු. 300,000 ක තොගයේ එදිනට ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය රු. 220,000 කි. එම තොගය 2015.04.21 වන දින රු. 20,000 ක විකුණුම් වියදමක් දරා රු. 280,000 ට විකුණා ඇත.

2) පරිපාලන වියදම් පිළිබඳ විශ්ලේෂණය මෙසේය. (රු. '000)

| | (රු. '000) |
|---|---|
| ගෙවූ වැටුප් (ශුද්ධ) | 920 |
| අධ්‍යක්ෂ සංවේතන | 780 |
| විගණන ගාස්තු | 120 |
| පොදු වියදම් | 270 |

3) වැටුප් ගිණුමෙන් දක්වෙන්නේ සේවක අර්ථ සාධක අරමුදල සඳහා 8% ක සේවක දායකය අඩු කිරීමෙන් පසු ගෙවූ ශුද්ධ වැටුප වේ. මීට අමතරව සමාගම 12% ක් දායකයක් ගෙවිය යුතු අතර 3% ක සේවක භාරකාර අරමුදල් දායකයක් ගෙවිය යුතුය.

4) 2015.03.31 දිනට උපචිත වැටුප් රු. 200,000 කි.

5) සමාගම භාණ්ඩ විකිණීමේදී වර්ෂයක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ අලෙවි කරයි. පසුගිය වර්ෂයේ විකුණුම් වගකීම් සහතික මත දැරූ රු. 240,000 ක අලුත්වැඩියා වියදම වැරදීමකින් විකුණුම් ගිණුම හර කර මුදල් ගිණුමට බැරකර ඇත. 2014/15 වර්ෂයේ විකුණුම් මත 5% ක් වගකීම් සහතික සඳහා වෙන් කිරීම් කළ යුතුය.

6) 2015.03.31 දින ඉඩම රු. 4,500,000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම ඉඩම පෙර වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද රු. 500,000 ක ප්‍රත්‍යාගණන අලාභය ආදායම් ප්‍රකාශයට හර කර ඇත.

7) 2014.04.01 දින පිරිවැය රු. 3,000,000 කට මෝටර් රථයක් කල්බදු ක්‍රමයට අත්කර ගන්නා ලදී. එය එදිනට වත්කමේ සාධාරණ අගයට සමාන විය. ගිවිසුම අනුව මූලික තැන්පතුව ලෙස රු. 500,000 ක් ගෙවා ඉතිරිය රු. 660,000 බැගින් වාර්ෂික වාරික 5 කින් ගෙවීමෙන් පසු මෝටර් රථය ව්‍යාපාරයට අයිති වේ. ගෙවූ තැන්පතු මුදල මූල්‍ය වියදම් යටතේ දක්වා ඇත. ගෙවූ පළමු වාරිකය මෝටර් රථ ගිණුමේ වාර්තා කිරීම හැර වෙනත් සටහනක් නැත. මෝටර් රථ පිරිවැය මත 20% කින් ක්ෂය කෙරේ. වසර 5 ක කාලයට අදාළ කල්බදු පොලී මෙසේ ය.

| වසර | පොලිය (රු.'000) |
|---|---|
| 2014/15 | 270 |
| 2015/16 | 202 |
| 2017/18 | 102 |
| 2018/19 | 78 |

8) ගොඩනැගිලි 5% කින් ද, මෝටර් රථ 20% කින් ද, උපකරණ 10% කින් ද පිරිවැය මත ක්ෂය කරන්න.

9) සමාගමට විරුද්ධව අස්කළ සේවකයෙකු පැවරූ නඩුවක් 2015.03.31 වන විටත් තීන්දුව ලැබී නොතිබිණි. සමාන නඩු කාරණාවක් සම්බන්ධයෙන් පෙර වර්ෂයක අස්කළ සේවකයෙකුට රු. 500,000 ක වන්දියක් ගෙවීමට අධිකරණ තීන්දුවක් මත සමාගමට සිදු වී ඇත.

10) 2014/15 ඇස්තමේන්තු ආදායම් බද්ද රු. 1,200,000 කි.

11) අධ්‍යක්ෂකවරු 2015.03.31 දින පහත තීරණයන් ගෙන ඇත.

i. 2015.03.31 පැවති සෑම සාමාන්‍ය කොටස් 2 කට 1 බැගින් වන සේ එකක් රු. 30 බැගින් වූ සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් සංචිත ප්‍රාග්ධනීත කිරීම.

ii. ඉහත (i) කරුණ සඳහා පොදු සංචිතයක් පිහිටුවීම හා එහි රු. 200,000 ක ශේෂයක් රඳවා ගනිමින් සංචිත ප්‍රාග්ධනීත කිරීම සඳහා අවශ්‍ය අරමුදල්, රඳවාගත් ලාභ ගිණුමෙන් පොදු සංචිත ගිණුමට මාරු කිරීම.

iii. සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු. 7.50 ක ලාභාංශයක් යෝජනා කිරීම.


OpenLearning © University of Sri Jayewardenepura Powered by Japura Media

අවශ්‍යවන්නේ; ප්‍රසිද්ධ කිරීම පිණිස ගිණුම් සටහන් සහිතව,

A) 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

B) 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

C) 2015.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (මුළු ලකුණු 20)

**(02) (අ)**

දර්ශි, මිනෝලි හා කුමුදු විසින් 2:2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් 2013.04.01 දින කුමුදු විශ්‍රාම ගනු ලැබීය. ඇයගේ හිමිකමින් රු. 200,000 ක් එදිනට ගෙවූ අතර ඉතිරි ප්‍රමාණය ණය ගිණුමකට මාරු කිරීමට එකඟ විණි. එම ණය ගිණුමේ හරි අඩක් ආසන්න ඉදිරි වසරේදී ගෙවීමටත් ඉතිරිය ඉන් පසු කොටස් වශයෙන් ගෙවීමටත් හවුල්කරුවෝ එකඟවිණි. කුමුදු විශ්‍රාම ගැනීමෙන් පසු දර්ශි හා මිනෝලි 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල පවත්වාගෙන යන අතර පහත කොන්දේසි හවුල් ගිවිසුමේ ඇතුළත් විය.

1. සෑම හවුල්කරුවෙකුටම වර්ෂය ආරම්භයේ පැවති ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත 10% ක වාර්ෂික පොලී හිමිවේ.

2. දර්ශිට මාසිකව රු. 6000 ක වේතනයක් හා මිනෝලි හා වාර්ෂිකව රු. 80,000 ක වේතනයක් හිමිවේ.

කුමුදු විශ්‍රාම යාමේදී එදිනට ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1,000,000 කට අගය කළ අතර එය හවුල්කරුවන් හෝ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපීමට එකඟ විය. 2014.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ උපුටාගන්නා ලද ශේෂ පිරික්සුම පහත වේ.

(රු.'000)

| | | හර | බැර |
|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ (ධාරණ අගය 2013.04.01 දිනට) | | 2,700 | |
| ප්‍රාග්ධන ගිණුම් 2013.04.01 දිනට | - D | | 1,200 |
| | - M | | 1,200 |
| | - K | | 800 |
| ජංගම ගිණුම් 2013.04.01 දිනට | - D | | 220 |
| | - M | 440 | |
| | - K | | 130 |
| විකුණුම් | | | 4,800 |
| ගැණුම් | | 2,400 | |
| 2013.04.01 දිනට තොගය | | 400 | |
| ණයහිමියෝ | | | 180 |
| ණයගැතියෝ | | 700 | |
| අඩමාණ ණය වෙන් කිරීම (2013.04.01) | | | 60 |
| මුදල් ගැනිලි | - D | 120 | |
| | - M | 150 | |
| බෙදාහැරීමේ වියදම් | | 250 | |
| පරිපාලන වියදම් | | 690 | |
| මූල්‍ය වියදම් | | 80 | |
| කුමුදුට ගෙවූ මුදල | | 200 | |
| බැංකු ශේෂය | | 460 | |
| | | 8,590 | 8,590 |



OpenLearning Powered by Japura Media

අතිරේක තොරතුරු

1. 2014.03.31 දිනට ව්‍යාපාරයේ පැවති තොගය රු. 270,000 කි.
2. හවුල් ව්‍යාපාරයට තම ගොඩනැගිල්ලක් 2013.10.01 දින කුළී පදනමට ලබාගත් අතර එදින 2014.09.30 න් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු. 120,000 ක් ගෙවා ඇත. එය පරිපාලන වියදම් හර කර ඇත.
3. දේපළ පිරියත උපකරණ මිලදී ගෙන ඇත්තේ 2010.10.01 වන දින වන අතර එදින සිට පිරිවැයට සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කර ඇත. මෙම වර්ෂය සඳහා ධාරණ අගයට 10% ක් ක්ෂය කිරීමට තීරණය කර ඇත.
4. වර්ෂය තුළදී හවුල් වේතන සම්පූර්ණයෙන් ගෙවා පරිපාලන වියදම් හර කර ඇත.
5. වර්ෂය අවසාන ණයගැති ශේෂය මත 10% ක් අඩමාණ ණය වෙන් කිරීම කළ යුතුය.
6. දර්ශි විසින් වර්ෂය තුළදී රු. 160,000 ක භාණ්ඩ ගැනිලි සිදුකර තිබුණත් ඒ පිළිබඳ කිසිවක් පොත්වල සටහන් කර නැත.

අවශ්‍ය වන්නේ;

i. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය.
ii. 2014.03.31 හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම්.
iii. 2014.04.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය. (ලකුණු 10)

**(ආ)** සීමිත අමිල සමාගමේ 2015 පෙබරවාරි හා මාර්තු මාසයන්ට අදාළව බැංකු ගණුදෙනු පහත දැක්වේ.

i. 2015.02.01 දිනට බැංකු ප්‍රකාශයේ ශේෂය රු. 300,000 ක් විය. මෙය එදිනට බැංකු ගිණුමේ ශේෂය සමග එකග නොවීය.

ii.

| | | රු.'000 |
|---|---|---|
| | පෙබරවාරි | මාර්තු |
| බැංකු ගිණුමට අනුව තැන්පත් කළ චෙක්පත් | 1,500 | 1,400 |
| බැංකු ගිණුමට අනුව නිකුත් කළ චෙක්පත් | 1,000 | 900 |
| උපලබ්ධි වූ චෙක්පත් | 1,100 | 300 |
| ගෙවීම සඳහා ඉදිරිපත් කළ චෙක්පත් | 800 | 150 |

- 2015.02.01 දිනට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 400,000 ක් පෙබරවාරි මස තුළදී ගෙවීමට ඉදිරිපත් වී ඇත. එදිනට උපලබ්ධි නොවූ චෙක්පත් රු. 600,000 ක් පෙබරවාරි මස තුළදී උපලබ්ධි වී ඇත.
- 2015.02.28 දිනට ඉදිරිපත් නොවූ චෙක්පත් මාර්තු මස තුළ ඉදිරිපත් වී ඇති අතර එදිනට උපලබ්ධි නොවූ චෙක්පත් මාර්තු මස තුළ උපලබ්ධි වී ඇත.

iii. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූවද බැංකු ප්‍රකාශයේ සටහන් වූ ගනුදෙනු පහත දැක්වේ.

| | | (රු.'000) |
|---|---|---|
| | **2015.02.28** | **2015.03.31** |
| ණයගැති ප්‍රේෂණ | 60 | 75 |
| තැන්පත් කළ එහෙත් අගරු වූ චෙක්පත් | 20 | 30 |
| බැංකු ගාස්තු | 15 | 10 |

අවශ්‍ය වන්නේ;

1. 2015.02.28 වන දිනට බැංකු ගිණුම (ව්‍යාපාරයේ) අනුව ශේෂය.
2. 2015.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු බැංකු ශේෂය.
3. 2015.03.31 දිනට බැංකු සැසඳුම ප්‍රකාශය. (ලකුණු 10)

(මුළු ලකුණු 20)



OpenLearning Powered by Japura Media

**(03) (අ)** සීමිත සහන් සමාගම A හා B නම් භාණ්ඩ 2 ක් නිෂ්පාදනය කරයි. එහි එකලස් හා නිමවුම් වශයෙන් නිෂ්පාදන දෙපාර්තමේන්තු 2 ක් ආපනශාලාවක් හා වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගනිමින් නිෂ්පාදන කටයුතු සිදුකරයි. 2014/15 වර්ෂය සඳහා අයවැයගත පොදුකාර්ය පිරිවැය පහත දැක්වේ.

| | (රු.) | | (රු.) |
|---|---|---|---|
| ගොඩනැගිලි කුලී | 120,000 | ආපන ශාලාවේ ආහාර | 20,000 |
| සේවක රක්ෂණය | 88,000 | ඖෂධ මිලදී ගැනීම් | 10,000 |
| යන්ත්‍ර ක්ෂය | 200,000 | | |
| යන්ත්‍ර සඳහා බලය | 40,000 | | |
| ආලෝකය සඳහා විදුලිය | 10,000 | | |
| නිෂ්පාදන කළමනාකාර වේතන | 100,000 | | |

| | එකලස් | නිමවුම් | ආපන ශාලාව | වෛද්‍ය මධ්‍යස්ථානය |
|---|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය (රු.) | 40,000 | 28,000 | | |
| සෘජු ශ්‍රම පිරිවැය (රු.) | 25,000 | 26,000 | 22,000 | 38,000 |
| වක්‍ර ද්‍රව්‍ය පිරිවැය (රු.) | 30,000 | 27,000 | 10,000 | 4,000 |
| වක්‍ර ශ්‍රම පිරිවැය (රු.) | 36,000 | 20,000 | 28,000 | 16,000 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | 40,000 | 30,000 | 20,000 | 10,000 |
| සේවක සංඛ්‍යාව | 30 | 20 | 10 | 10 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 1,000,000 | 500,000 | 300,000 | 200,000 |
| අයවැයගත යන්ත්‍ර පැය | 20,000 | 10,000 | 5,000 | 5,000 |
| අයවැයගත ශ්‍රම පැය | 40,000 | 2,000 | 1,000 | 1,000 |

- සේවක රක්ෂණයෙන් රු. 28,000 ක් වෛද්‍ය මධ්‍යස්ථානයට අදාළ වේ.
- ගොඩනැගිලි කුලී වලින් රු. 20,000 ක් පිරිපාලන කටයුතු පවත්වාගෙන යන ගොඩනැගිල්ලට අදාළ වේ.
- සේවා දෙපාර්තමේන්තු 2 හි පොදුකාර්ය පිරිවැය සම සමව නැවත නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර බෙදා හරිනු ලැබේ.
- නිෂ්පාදිත සඳහා අදාළ පැය හා පිරිවැය අගයන් පහත දැක්වේ.

| | **A** | **B** |
|---|---|---|
| සත්‍ය යන්ත්‍ර පැය | 2 | 4 |
| සත්‍ය ශ්‍රම පැය | 3 | 5 |
| සත්‍ය ද්‍රව්‍ය පිරිවැය (රු.) | 600 | 800 |
| ශ්‍රම පැයක පිරිවැය (රු.) | 30 | 100 |

අවශ්‍යවන්නේ;

i. නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය විභජනය කිරීමේ පත්‍රිකාව

ii. සේවා දෙපාර්තමේන්තුවල පොදුකාර්ය පිරිවැය නැවත නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට විභජනය කිරීම.

iii. සුදුසු පදනම් යොදාගෙන නිෂ්පාදන දෙපාර්තමේන්තුවල පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය අනුපාතයන් ගණනය කරන්න.

iv. A හා B නිෂ්පාදිතයන්ගේ ඒකක පිරිවැය ගණනය කරන්න. (ලකුණු 8)


OpenLearning Powered by Japura Media

**(ආ)** 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා ණයගැතියන්ගේ තොරතුරු සාරාංශගතව පහත දැක්වේ.

රු.'000

| විස්තරය | සසිත් | රෂාන් | යේෂක | සඳුන් | එකතුව |
|---|---|---|---|---|---|
| 14.04.01 ශේෂය | 200 | 150 | 300 | 75 | 725 |
| විකුණුම් | 800 | 700 | 450 | 220 | 2,170 |
| ආපසු එවුම් | - | 50 | - | 25 | 75 |
| දුන් වට්ටම් | 80 | 20 | - | - | 100 |
| මුදල් ලැබීම් | 400 | 880 | 200 | 270 | 1,750 |
| බොල් ණය | | 30 | 50 | - | 80 |

ඉහත තොරතුරු පොදු ලෙජරයේ හා ණයගැති ලෙජරයේ වාර්තා කිරීමේදී පහත වැරදි සිදුවී ඇත.

(1) විකුණුම් ජර්නලය එකතු කිරීමේදී රු. 70,000 ක් වැඩියෙන් එකතු කර ඇත.

(2) රෂාන් ආපසු එවූ භාණ්ඩ පොදු ලෙජරයේ රු. 5,000 ක් අඩුවෙන් සටහන් වී ඇති අතර ණයගැති ලෙජරයේ සටහන් වී නැත.

(3) සසිත්ට දුන් වට්ටම් ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වී ඇත.

(4) බොල්ණය සටහන් කිරීම ව්‍යාපාරය පොත්වලින් මගහැරී ඇත.

(5) පාලන ගිණුමේ බැර පැත්ත රු. 10,000 ක් අඩුවෙන් එකතුකර ඇත.

අවශ්‍ය වන්නේ;

1. නිවැරදි ණයගැති පාලන ගිණුම

2. දෝෂ සහිත ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුව

3. වැරදි ණයගැති පාලන ගිණුමේ ශේෂය හා දෝෂ සහිත ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුව සැසඳීමේ ප්‍රකාශය. (ලකුණු 7)

(මුළු ලකුණු 15)

**(04) (අ)** සීමිත ගොල්ඩන් සිටි සමාගමේ පහත මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය රු.'000

| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | 17.03.31 | 18.3.31 | **ජංගම නොවන වත්කම්** | 17.03.31 | 18.03.31 |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටසක අගය රු.20) | 5,000 | 6,500 | දේපළ පිරියත හා උපකරණ | 6,000 | 7,800 |
| **සංචිත** | | | **ජංගම වත්කම්** | | |
| පොදු සංචිතය | 200 | 250 | තොගය | 350 | 380 |
| රඳවාගත් ලාභ | 600 | 600 | වෙළඳ ලැබියයුතු | 310 | 300 |
| | | | ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල් | 50 | - |
| **ජංගම නොවන වගකීම්** | | | බැංකු | 250 | 490 |
| ණයකර 20% | 300 | 400 | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ ගෙවියයුතු | 400 | 710 | | | |
| උපචිත පොලී | - | 20 | | | |
| උපචිත බදු | 60 | 90 | | | |
| ගෙවිය යුතු ලාභාංශ | 400 | 400 | | | |
| | 6,960 | 8,970 | | 6,960 | 8,970 |



OpenLearning Powered by Japura Media

2018.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය රු.'000

| | |
|---|---|
| විකුණුම් | 7,500 |
| විකුණුම් පිරිවැය | (3,500) |
| දළ ලාභය | 4,000 |
| වෙනත් ආදායම් | 550 |
| | 4,550 |
| වියදම් | 2,150 |
| ක්ෂය | (450) |
| පොලී | (60) |
| බදු පෙර ලාභය | 1,890 |
| ආදායම් බදු | (290) |
| වර්ෂයේ ලාභය | 1,600 |

අතිරේක තොරතුරු:

1. ධාරණ අගය රු. 1,700,000 ක් වූ වෑන් රථයක් විකිණීමෙන් ලද ලාභය වෙනත් ආදායම් වේ.
2. නව ගබඩා ගොඩනැගිල්ලක් මිලදීගෙන නියමිත පරිදි වාර්තා කර ඇත.
3. රඳවාගත් ලාභ උපයෝගී කරගෙන 2017.04.01 පැවති සෑම සාමාන්‍ය කොටස් 5 කට 1 බැගින් එකක් රු. 20 බැගින් වූ සාමාන්‍ය කොටස් නිකුත් කර ඇත.
4. වර්ෂය තුළ හිමිකම් නිකුතුවක් සිදුකර නියමිත පරිදි වාර්තා කර ඇත.
5. 2018.03.30 දින ණයකර නිකුතුවක් සිදුකර ඇත.
6. වර්ෂය අගදී කොටස් හිමියන්ට ලාභාංශ ගෙවා ඇත.

අවශ්‍යවන්නේ; 2018.03.31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය. (ලකුණු 10)

**(ආ)** එකම කර්මාන්තයේ නියුතු සමාගම් 2 කට අදාළ සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

(රු.'000)

| | A සමාගම | B සමාගම |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 5,200 | 8,380 |
| ණයගැතියෝ | 2,240 | 4,500 |
| ණයහිමියෝ | 6,500 | 8,500 |
| 8% ණයකර | 1,000 | 2,000 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 6,000 | 10,000 |
| රඳවාගත් ඉපයීම් | 2,000 | 2,000 |
| **ආදායම් ප්‍රකාශයේ සාරාංශය** | | |
| විකුණුම් | 11,200 | 16.800 |
| විකුණුම් පිරිවැය | 8,000 | 11,200 |
| මෙහෙයුම් වියදම් | 1,200 | 800 |
| පොලී වියදම් | 80 | 160 |
| ආදායම් බදු | 920 | 8,240 |


OpenLearning Powered by Japura Media

අවශ්‍යවන්නේ;

1. ඉහත සමාගම් 2 ට අදාළව පහත අනුපාත ගණනය කරන්න.
   - i. හිමිකම් ප්‍රතිලාභ අනුපාතය
   - ii පොලී ආවරණ අනුපාතය
   - iii. ණයගැති පිරිවැටුම් අනුපාතය
   - iv. ණය ස්කන්ධ අනුපාතය

2. ඉහත ගණනය කිරීම්වලට අනුව;
   - i. ඉතා ඉක්මණින් ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගන්නේ කුමන සමාගම ද?
   - ii. කොටස් හිමියන්ගේ ආරක්ෂාව වැඩි කුමන සමාගම ද? (ලකුණු 5)

(මුළු ලකුණු 15)

**(05)** සත්සර ව්‍යාපාරයේ 2014.01.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටාගත් ශේෂයන් පහත වේ.

| | රු. | රු. |
|---|---|---|
| ගොඩනැගිලි (ධාරණ) | 810,000 | |
| තොගය | 70,000 | |
| වෙළඳ ලැබියයුතු (ශුද්ධ) | 180,000 | |
| ඉදිරියට ගෙවූ විදුලිය | 20,000 | |
| මුදල් | 50.000 | |
| වෙළඳ ගෙවියයුතු | | 200,000 |
| බැංකු ණය | | 160,000 |

වර්ෂයේ පළමු කාර්තුව තුළ පහත ගණුදෙනු සිදුවිය.

1. රු. 150,000 ක් වටිනා භාණ්ඩ ණයට මිලදී ගෙන ඇත.
2. රු. 120,000 ක් පිරිවැය වූ භාන්ඩ රු. 200,000 කට ණයට විකුණා ඇත.
3. ණය හිමියන්ට රු. 50,000 ක් ගෙවූ අතර ලද වට්ටම රු. 5,000 කි.
4. ණය ගැතියන් විසින් රු. 15,000 ක් පිරිවැය වූ භාණ්ඩ ආපසු එවා ඇත.
5. ණයගැති ශේෂය මත වාර්ෂිකව 10% ක් අඩමාණ ණය වෙන් කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ.
6. ගොඩනැගිලි වාර්ෂිකව 10% ක් ක්ෂය කරයි. මෙම ගොඩනැගිලි මිලදී ගෙන ඇත්තේ 2013.01.01 දිනය.

අවශ්‍යවන්නේ;

i. ඉහත ගණුදෙනුවල බලපෑඹ ගිණුම්කරණ සමීකරණයේ පහත ආකෘතිය මගින් දක්වන්න.

ගොඩනැගිලි + තොගය + ණයගැති + ඉදිරියට ගෙවීම් මුදල් = ප්‍රාග්ධනය + වගකීම්

ii. 2014 පළමු කාර්තුව සඳහා ව්‍යාපාරයේ ලාභය/ අලාභය

iii. 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (මුළු ලකුණු 15)

**(06) (අ)** 'මෙකැනික්ස්' කාර්මික ආයතනයේ 2015 විෂයට අදාළ කම්හල් සේවකයන්ගේ මූලික වැටුප් පහත දක්වේ.

| | (රු.) | | | |
|---|---|---|---|---|
| සරත් | 192,000 | අතිකාල පැය | සරත් | 5 |
| අමල් | 216,000 | | අමල් | 8 |
| හසිත | 240,000 | | හසිත | 6 |



OpenLearning Powered by Japura Media

- මසකට පැය 8 බැගින් වැඩකළ යුතු දින ගණන 25 කි.
- අතිකාල වැඩ වෙනුවෙන් සාමාන්‍ය පැයක වැටුප මෙන් 1 1/2 ගුණයක් ගෙවනු ලැබේ.
- සෑම සේවකයෙකුටම රු. 10,000 බැගින් මාසික දිරිදීමනාවක් හා රු. 24,000 බැගින් වාර්ෂික ප්‍රසාද දීමනාවක් හිමිවේ.
- සේවක අර්ථ සාධක අරමුදලට, අතිකාල දීමනාව හැර සේවක දළ වැටුපෙන් 10% ක් සේවක දායකය හා 15% ක් සේව්‍ය දායකය ලෙස ගෙවනු ලැබේ.
- සෑම සේවකයෙකුටම මාසිකව රු.500 ක් සුබ සාධන සමිතිය වෙනුවෙන් ගෙවිය යුතුය.
- සෑම මසකම වැටුප ඊළඟ මාසයේ 10 වන දින ගෙවනු ලබයි.

  i. 2015 ජනවාරි මාසය සඳහා වැටුප් ලේඛනය දක්වන්න.

  ii. වැටුපට අදාළ අයිතමයන් වාර්තා කිරීමේ ජර්නල් සටහන් ලියන්න.

  iii. ඉහත දළ වැටුප තුළ අඩංගු සෘජු වේතනය කොපමණ ද? (ලකුණු 9)

**(ආ)** සිසිල් බීම නිපදවන 'ඩ්‍රින්ක් වෙල්' සමාගම නව සිසිල් බීම නිෂ්පාදනයක් හඳුන්වා දීමට සැලසුම් කරයි. ඊට අදාළ වාර්ෂික අයවැය තොරතුරු පහත වේ.

| | රු. |
|---|---|
| ඒකකයක විකුණුම් මිල | 60 |
| ඒකකයක විචල්‍ය පිරිවැය | 36 |

- මාසිකව ප්‍රචාරණය සඳහා රු. 5,000 ක් වැය කිරීමට අයවැයගත කර ඇත.
- සේවක වේතන සඳහා වාර්ෂිකව රු. 200,000 ක් ද ගෙවල් කුලී සඳහා වාර්ෂිකව රු. 40,000 ක්ද වෙන් කර ඇත.

අවශ්‍යවන්නේ;

i. මෙම කාර්යයේ මුළු පිරිවැය ආවරණය කර ගැනීමට විකිණිය යුතු ඒකක ප්‍රමාණය.

ii. ඒකක 20,000 ක් විකිණීමේදී ඇස්තමේන්තුගත වාර්ෂික ලාභය

iii. ලාභ සමච්ඡේදන ප්‍රස්තාර සටහන ඇඳ (ii) ට අනුව ආරක්ෂිත ආන්තිකය දක්වන්න.

(ලකුණු 6)

(මුළු ලකුණු 15)

**(07) (අ)** සීමිත ඒෂියා සමාගම නව යෝගට් නිෂ්පාදනයක් වෙළඳපළට හඳුන්වාදීමට තීරණය කරයි. වර්ෂ 4 ක කාලයක් තුළ අදාළ සැලසුම පහත දැක්වේ.

| | රු. |
|---|---|
| • ව්‍යාපාරයේ වාර්ෂික ස්ථාවර පිරිවැය | 450,000 |
| • වෙළඳපළ සමීක්ෂණය සිදුකළ ආයතනයේ ගාස්තුව | 50,000 |
| • යෝගට් නිෂ්පාදන යන්ත්‍රයේ ගැණුම් මිල | 1,000,000 |
| • යන්ත්‍රයේ ප්‍රවාහන පිරිවැය | 50,000 |
| • යන්ත්‍රයේ සුන්බුන් විකුණුම් මිල | 275,000 |
| • වර්ෂ 4 අවසානයේ යන්ත්‍රයේ සුන්බුන් අගය | 25,000 |

යෝගට් 1 ක් සඳහා අමුද්‍රව්‍ය පිරිවැය රු. 10 ක්ද ශ්‍රම පිරිවැය රු. 5 ක්ද, සෘජු වෙනත් පිරිවැය රු. 5 ක්ද වේ. යෝගට් 1 ක් විකිණීමට අපේක්ෂිත මිල රු. 35 කි. වාර්ෂික විකුණුම් ඒකක සංඛ්‍යාව පහත දැක්වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| ඒකක | 20,000 | 25,000 | 28,000 | 24,000 |


OpenLearning © University of Sri Jayewardenepura Powered by Japura Media

ඉහත වාර්ෂික ස්ථාවර පිරිවැය තුළ ඇතුළත්, ව්‍යාපෘතිය නිසා හටගන්නා අතිරේක වාර්ෂික ස්ථාවර පිරිවැය රු. 350,000 කි.

මෙම ව්‍යාපෘතිය ඇරඹීම නිසා ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධනය රු. 100,000 සිට 200,000 දක්වා ඉහළ යනු ලැබේ.

12% ප්‍රාග්ධන පිරිවැයට අදාළ වට්ටම් සාධක පහත දැක්වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.89 | 0.8 | 0.79 | 0.63 |

අවශ්‍යවන්නේ;

i. මූලික ආයෝජනයේ වර්තමාන අගය ගණනය කරන්න.

ii. අවසන් වර්ෂයේ මුදල් ගලා ඒම් හා මුදල් ගලායාම් දක්වන්න.

iii. ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය ගණනය කර එය ක්‍රියාත්මක කිරීමේ යෝග්‍යතාව පරීක්ෂා කරන්න. (ලකුණු 10)

**(ආ)** 2015.03.31 දිනට හියිටෙක් සමාගමේ දේපළ පිරියත තොරතුරු පහත දැක්වේ.

**රු.'000**

| | පිරිවැය | 2014.03.31 ට ධාරණ අගය | සුන්බුන් අගය | ඵලදායී ජීවකාලය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 7,000 | 1,000 | - | 25 |
| මෝටර් රථ | 5,000 | 3,200 | 500 | 5 |

- ඉඩමේ පිරිවැය රු. 4,500,000 ක
- 2014.04.01 දින ගොඩනැගිල්ල රු. 1,250,000 ක් දරමින් පුළුල් කරන ලද අතර අලුත්වැඩියා වියදම් රු. 20,000 ක්ද දරණ ලදී. පුළුල් කිරීම නිසා ගොඩනැගිල්ලේ ඵලදායී ජීව කාලය වසර 30 ක් දක්වා වැඩිවිය.
- 2014.10.01 දින මෝටර් රථය රු. 3,000,000 කට විකුණන ලදී. එදිනම රු. 4,000,000 කට තව මෝටර් රථයක් මිලදී ගන්නා ලදී. එහි ඵලදායී ජීව කාලය වර්ෂ 8 ක් වන අතර සුන්බුන් අගය රු. 800,000 කි.

අවශ්‍ය වන්නේ,

i. 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ පිරියත හා උපකරණ මත ක්ෂය වියදම ගණනය කරන්න.

ii. 2015.03.31 දිනට දේපළ, පිරියත හා උපකරණ ධාරණ අගය දක්වන්න.

iii. මෝටර රථ ඉවත් කිරීමේ ගිණුම දක්වන්න. (ලකුණු 5)

(මුළු ලකුණු 15)



OpenLearning © University of Sri Jayewardenepura Powered by Japura Media

ගිණුම්කරණය II
**04. අ**
පිළිතුර

සීමිත ගෝල්ඩන් සිටි සමාගම
2018.03.31 න් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.'000

| | | |
|---|---|---|
| <u>මෙහයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහ</u> | | |
| බදු පෙර ලාභය | 1890 | |
| වෑන් රථ විකුණුම් ලාභය | (550) | |
| ක්ෂයවීම් | 450 | |
| පොලී වියදම් | 60 | |
| | 1850 | |
| තොග වැඩි වීම් | (30) | |
| ණයගැති අඩු වීම | 10 | |
| ණය හිමි වැඩි වීම | 310 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ මුදල් | 2140 | |
| ගෙවූ බදු | (260) | |
| ගෙවූ පොලී | (40) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 1840 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහ</u> | | |
| වෑන් රථ විකුණුම් | 2250 | |
| ගොඩනැගිලි මිලට ගැනුම් | (3950) | |
| ආයෝජන ක්‍රියාකාරකම් තුල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (1700) |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහ</u> | | |
| සාමාන්‍ය කොටස් නිකුතුව | 500 | |
| ණයකර නිකුතුව | 100 | |
| ලාභාංශ ගෙවීම් | (550) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රමාණය | | 50 |
| වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම | | 190 |
| 2017.04.01 මුදල් හා මුදල් සමාන දෑද | | 300 |
| 2018.03.31 මුදල් හා මුදල් සමාන දෑද | | 490 |

OpenLearning © University of Sri Jayewardenepura Powered by Japura Media